පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සබරගමුව- සතිපාසල

සතිය- 12

විෂය:- නර්තනය

Prepared by-කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

ශ්‍රේණිය :- 11

# මනිපූරි නර්තන සම්ප්‍රදාය



# මනිපුරි නර්තන අංග

## 01.රාස්ලීලා නර්තනය

රාධා හා ක්‍රිෂ්ණාගේ ප්‍රේම වෘතාන්තය තේමා කර ගනිමින් මෙම නර්තන අංගය නිර්මාණය වී ඇත. විවිධ උත්සව අවස්ථා නියෝජනය කරන ලද රාස්ලීලා වර්ග **07** ක් මනිපුරි නර්තනයට අදාළව පවත්වා ගෙන එන ලදී.

**මහා රාස්,වසන්ත රාස්, කුංජ රාස්,නෘත්‍ය රාස්, ගෝපා රාස් යන පංච රාස් ඒ අතර ප්‍රධාන වේ.**





## 02. පරෙංග්

මනිපුරි නර්තනයෙහි මූලික අභ්‍යාස වන **“චාලි ”** වල සුවිශේෂ පද කොටස් “පරෙංග්” නමින් හැඳින්වෙන අතර ඒවා ද වර්ගීකරණය කොට ඇත.

## 03.පුංග් චෝලම්

පුංග් නම් වූ බෙරය කරෙහි ලාගෙන කණ්ඩායමක් විසින් කරන ලද බෙර වාදන නර්තනයකි.මෙය ඉතා සංකීර්ණ බවින් යුක්ත වන අතර, විවිධ ආගමික හා සමාජයීය අවස්ථා වලදී රඟ දක්වනු ලැබේ.





## 04. කර්තාල් චෝලම්

විවිධ තාල මත කෙරෙන සාමූහික තාලම් නර්තනයකි.






## 05.සංකීර්තන්





# මනිපූරි රංග වස්ත්‍රාභරණ

## ❖ කාන්තා රංග වස්ත්‍රාභරණ (රාධාගේ හා ගෝපිකාවන්ගේ )

**කුමින්** - ගෝපිකාවන්ගේ ඉහටියේ සිට වළලුකර තෙක් වැසෙන සේ සකස් කළ බැරලයක ආකෘතිය ඇති සාය මෙනමින් හැදිනවේ.මෙය රන් රිදී නූලෙන් අලංකාර මෝස්තර සහිතව ගෙත්තම් කර ඇත.තැනින් තැන පළිඟු කැට හා තුනී කණ්ණාඩි කැබලි අල්ලා දිස්නය හා චමත්කාරය ලබාගෙන ඇත.

**පොශ්වාන්** - කුමින් සායට උඩින් ඒ මත විනිවිද පෙනෙන සුදු පැහැති දුහුල් රෙද්දෙන් මසන ලද කෙටි සාය මෙනමින් හැදින්වේ.එය ඉතා අලංකාර රැලි සහිත ව දිස් වූ චමත්කාරය වැඩි කරන රංග වස්ත්‍ර කොටසකි.

**ක්වංගොයි** - ඉනට පළඳින පටිය

රිෂම්පුරිට්-උඩුකය සඳහා අඳිනු ලබන විල්ලුද හැට්ටය මෙය වේ.මෙය කළු,රතු හෝ කොළ පැහැති තද වර්ණයෙන් සැකසී ඇත.අත් ,කර,ඉඟ පෙදෙස රන්වන් බෝඩරවලින් අලංකාර කර ඇත.


**මයිකුම්** - හිසට පළඳින වේලය

**කොක්තුම්බි** -හිස් පළඳනාව

**කුදොස්** - දැතට පළඳින වළලු විශේෂයකි.

**කුණ්ඩලානි** - කනට පළඳින කරාබු

## ❖ කාන්තා රංග වස්ත්‍රාභරණ



# ❖ පිරිම් රංග වස්ත්‍රාභරණ

**ධෝතිය** -යටිකයට අදිනු ලබන ඇඳුම මේ නමින් හැදින්වේ.මෙය ගෙත්තම් කර අලංකාර කරනු ලබයි.


**මකුට පළඳනාව** - ක්‍රිෂ්ණ සඳහා පමණක් වෙන් වූ සුවිශේෂ ගෞරවයක් දක්වන්නා වූ ආභරණයකි.මෙය මොණර පිහාටුවක ආකෘතියකින් සරසා තිබීම ද විශේෂත්වයකි.

**කුදොස්** -දෑතට පළඳින වළලු විශේෂයකි.



## <u>පැවරුම</u>

**01.** මනිපුරි නර්තන සම්ප්‍රදාය ලොවට හඳුන්වා දුන් මහා කවියා කවුරුන්ද?



**02.** මනිපුරි නර්තන සම්ප්‍රදායේ දක්නට ලැබෙන නර්තන අංග තුනක් නම් කරන්න.

**03.**රාධාගේ රංග වස්ත්‍රාභරණ කට්ටලයේ රංග වස්ත්‍රාභරණ තුනක් නම් කරන්න.

**04.**ක්‍රිෂ්ණාගේ රංග වස්ත්‍රාභරණ කට්ටලයේ රංග වස්ත්‍රාභරණ තුනක් නම් කරන්න.

**05.**රංග වස්ත්‍රාභරණවල සුවිශේෂ ලක්ෂණ මොනවාද?

<u>සැකසුම</u>

කේ.එච්.එච්.ජී දිල්රුක්ෂි කුමාරි සෙනවිරත්න

කෑ /රංවල මහානාග ම.වි

කෑගල්ල කලාපය